# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1773/26 - 2012 අගෝස්තු මස 29 වැනි බදාදා - 2012.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : 4/3/1 (පත් කිරීම් - අත්පත්)

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි අධිකාරය)

460 වැනි අධිකාරය මත ඉඩම් අත්කර ගැනීමේ පනතේ 63(2)අ වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් නියෝගය මෙයින් නියම කරමි.

නියෝග අංක 2012/5 - පත් කිරීම්

දැදුරුඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීම පිණිස I උපලේඛනයේ දක්වා ඇති ප්‍රදේශ තුළ II වැනි උපලේඛනයේ දක්වා ඇති නිලධාරියාට III වැනි උපලේඛනයේ දක්වා ඇති කාලසීමාව දක්වා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීමේ කාර්ය සඳහා නියමිත නිලධාරියකු ලෙස මෙයින් නියම කරනු ලැබේ.

| *I වැනි උපලේඛනය*<br>*බල ප්‍රදේශය* | *II වැනි උපලේඛනය*<br>*නිලධාරියාගේ නම* | *III වැනි උපලේඛනය*<br>*කාලසීමාව* |
|---|---|---|
| වාරියපොල<br>ප්‍රාදේශීය ලේකම්<br>කොට්ඨාසය | ඩබ්. එම්. ඒ. ඩබ්. දොරටියාව මහතා<br>(විශ්‍රාමික සහකාර ඉඩම් කොමසාරිස්) | 2012.09.01 දින සිට<br>2013.09.01 දින දක්වා |

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2012 අගෝස්තු මස 23 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

09-375

1A - G 16525— 355 (2012/8) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.